# අඳුරු කුටිය තුළ

ශ්‍රී ලංකාවේ මෑත කාලීන ඉතිහාසය කියවන්නෙකුට හැත්තෑව, අසූව දශක දෙක වෙනම ම කැපී පෙනෙන්නේ අපගේම කලාවන් ඉහළට නැංවුන වකවානුවක් ලෙසින්. ගීතය පමණක් ම නොව, අන් සියලු කලාවන්ගේ පුනරුදයට හේතුව වන්නේ කලා නිර්මාණත්, නිර්මාණකරුවනුත්, ඊට දායක වූ ශිල්පීනුත් ඇසුරින් බිහිවන ප්‍රබුද්ධ රසික පෙළයි. මේ සියළු දෑ වෙනුවෙන් ඇප කැප වෙමින් සද්භාවයෙන් යුතුව සිය දායකත්වය දුන් පූරෝගාමීන් ද නිරතුරුව



සිහිපත් කළ යුතු වන්නේ ස්තුතිපූර්වකවයි. මෙවර "සන්නස" මාසිකයේ "ගී සඳළුවට" ඉතාමත්ම අර්ථාන්විත, රසවත්, මධුර ගීයක් සමඟින් ගොඩවූයේ ප්‍රවීණ ගායක ශිල්පී ටී.එම්. ජයරත්නයන්. ඒ දුරකථනය මඟින්. ගීතය "අඳුරු කුටිය තුළ" ගීතයයි. දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ රසික සවන් පින වූ, රසික මනැස ඇවිල වූ මේ ගීය පිළිබඳව ටී.එම්. ජයරත්නයන් සිය මතකය අවදි කළේ මෙලෙසින්;

"මේ ගීතය ගුවන් විදුලියේ කෙරුනේ එක්දාස් නවසිය හැත්තෑ හයේ විතර. ඒ දවස්වල ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යකෂ ජෙනරාල් තනතුර දැරුවේ රිජ්වේ තිලකරත්න මහත්තයා. ඇත්තට ම එතුමා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්"
ටී.එම්. ජයරත්නයන් එදා ඒ පසුබිම සකස් කළ පූරෝගාමීන් පිළිබඳව සිහිපත් කරමින් කතාවට මුල පිරුවා. ඒ මහත්මයා "ප්‍රබුද්ධ ගීත" කියලා වාඩ සටහනක් කරන්න පටන් ගත්තා. ඉතින් ඒ වැඩ සටහනට ගී පද රචනා එවන්න කියලා ගුවන් විදුලියේ දැන්වීම් ප්‍රචාරය කළාම ගුවන් විදුලියට තැපෑලෙන් ආව පද රචනාවක් තමයි "අඳුරු කුටිය තුළ" ගීතය.

තැපැල් මඟින් ලැබුණු උසස් නිර්මාණයක්, සැඟවී නො යා, එම නිර්මාණකරුවාගේ නමින් ම ගීතයක් බවට පත් වීම වර්තමානයේ නම් සිනළුවක්. නිසි-දේ ට නිසි තැන ලබා දීමට උත්සුක වූවන්ට අප කෘතවේදී විය යුතු වන්නේ ඒ නිසාවෙනි.
"ඔය ගීතය ලියලා තියෙන්නේ ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ කියන මහත්මයායි. භාරතයේ හිටපු රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ "ගීතාවලියේ" එන ගීතයක අදහසයි අලවත්තගේ මහත්මයා මේ අපූරුවට සිංහලයට හරවලා අපිට හොඳට දැනෙන අපේ ම ගීතයක් විදියට ලියලා තියෙන්නේ".

විශ්ව සාහිත්‍යය අපගේ කලාවන්ට මුහු වීම කලින් කලට නිරතුරුවම සිදුවෙන්නක්. ඒ නිර්මාණවල සාර්ථකත්වය රඳා පවතින්නේ ඒවා අපේ දේට ළං වෙන තරමටයි.

අඳුරු කුටියක දොර කවුළු වසා ගෙන කෙරෙනා යාතිකා, කන්නලව් දෙවියන්ට නෑසෙයි. ගොවිතැන්






සිසිර දිසානායක

වුවත් එකල එම පරිසරයේ ම බිහිවුණ තවත් අංශයක් පිළිබඳව සිහිපත් කිරිමටත් ටී.එම්. ජයරත්නයන් අමතක කළේ නෑ.
"ඒ තමයි ජන සංගීත පර්යේෂන අංශය. ඒ අංශය භාරව හිටියේ සී.ද.එස්. කුලතිලක මහත්තයයි. ඒ දවස්වල ඩබ්ලිව්. බී. මකුලොළුව මහත්තයත් එක්ක කරගෙන ගිය ජන ගීත එකතු කිරිමේ සද්කාර්යට කුලතිලක මහත්තයාගේ තිබුණෝ ලොකු දායකත්වයක්. ගමින් ගමට ගිහින් වයසක ගැමියන්ගේ හඬින් පටිගත කරගෙන ආව ජන ගී, කවි සංරක්ෂණය කරන්න ඕන නිසා අපි ලවා නැවත ගායනා කරවලා තැටිගත කළේ කුලතිලක මහත්මයයි. ඒත් ඒ ජනගායනා ගැන හරි අවබෝධයක් නැති අය පස්සේ කාලෙක ඒ වැඩසටහන්වලට සම්බන්ධ වුණ නිසා ඒ දේවල් දිගටම කරගෙන යන්න අමාරු වුණා.

අඳුරු කුටිය තුළ
දොරගුළු ලා ගෙන
ගයන ගීතිකා - යදින යාතිකා
දෙවියන් හට නෑසේ
පොළව කොටන තැන
පාර හදන තැන
ගිනියම් අව්වේ - මහ වරුසාවේ
දෙවියෝ වැඩ ඉන්නේ
බලන් කඩතුරා හැර දෑසේ......

සිනිඳු සුවැති සළු සිරසින් හැ රදා
දුවිලි මඩ වැටී පිළිගත පළඳා
දෙවියන් රුව දක්නට හැක්කේ......

කුසුම් සඳුන් දුම් සුවඳින් වැළකී.
ගත නැගි දාදිය සුවඳින් සැරසී
දෙවියන් හා එක් විය හැක්කේ......

ගායනය : ටී.එම්. ජයරත්න
පද රචනය - ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ
සංගීතය - ප්‍රේමසිරි කේමදාස

ගැඹුරු, මිහිරි හඬින් ළයාන්විතව ගැයෙන ටී.එම්. ජයරත්නයන්ගේ ගායනාවල මුහුවුණ ගැමි හඬ නිර්ව්‍යාජයි. පසු කලෙක ලයනල් රන්වලයන් ජන ගී ඇසුරින් කළ නිර්මාණවලට පවා ජයරත්නයන් සිය ගැමි හඬ මුහු කළේ ඉතා නිහතමානීවයි.
දොඩන්වල ඉපිද එහි ප්‍රාථමික විද්‍යාලයෙන්ද, සිප් සතර හැදෑරූ ටී.එම්. ජයරත්නයන් හට ගැමිකම ආගන්තුක දෙයක් නෙවෙයි. හේවුඩ් ආයතනයෙන් සංගීතය හදාරා, රාජගිරියේ හේවාවිතාරණ මහා විද්‍යාලයේ සංගීතාචාර්යවරයා වශයෙන් කටයුතු කර, අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ අධ්‍යක්ෂක වරයෙකු ලෙසින් විශ්‍රාම ගිය ටී.එම්. ජයරත්නයන්ට සංගීතය අතැඹුලක් වගෙයි. "ගාන තෙල් සඳුන්" ගීය ගයමින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ශිල්පීය ගායකයෙකු වී, මියැසියේ සුරුවන් ඇසුරේ ගී සිය දහස් ගණනක් ගැයූ ජයරත්නයන්ගේ ගායනා තවමත් තරුණයි. වසර 1978, 1979, 1980, 1987 ජනාධිපති සම්මානයෙන්, වසර 2002 දී රාජ්‍ය සංගීත උළලේ සම්මානයෙන් පුද ලද ටී.එම්. ජයරත්නයන් අදටත් තමන්ගේ රසිකයින් අතර එදා මෙන් ම ජනප්‍රිය යි.

"ගී සඳළුව" වෙනුවෙන් සිය වටිනා කාලය මිඩංගු කළාට ස්තූතිවන්ත වෙමින් අප පිළිසඳර නිමා කළා.




විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර
ගුවන්විදුලිය www.thisara.com

